# 21
# නූතන සමාජයෙන්

" උදාර මනුෂ්‍යත්වයෙන් යුතු සමාජයක සාමකාමී සහජීවනය දකින්නට ලැබේ " .........
- ප්‍රවෘත්තියක් -

මෙවැනි පුවත් නිතර අසන්නට ලැබේ. එහෙත් වර්තමාන ශ්‍රී ලංකාවේත්, ලෝකයේත් යථාර්ථය වී ඇත්තේ බිඳ වැටුණු මානව සබඳතා හේතුවෙන් සාමකාමී සහජීවනය පළුදු වූ තත්ත්වයකි. එහෙත් මිනිසා ජීවත් කරවීම සඳහා සාමකාමී සහජීවනය හැර වෙනත් විකල්පයක් නොමැත. ඒ නිසා ම සාමකාමී සහජීවනය යන්න නූතන සමාජයේ තේමා පාඨය විය යුතු ය.

අද අපි බහුවිධ පරිසරයක ජීවත් වෙමු. එම සමාජය විවිධ ජන වර්ග, විවිධ ආගම්, භාෂා, සංස්කෘති හා විවිධ දෘෂ්ටීන්ගෙන් සමන්විත ය. හුදෙකලා වීම හා බිඳ වැටුණු සබඳතා සහිත තත්ත්වයක් තුළ පූර්ණත්වයක් කරා ළඟා විය නොහැකි ය. එය පදනම් විය යුත්තේ, යුක්තිය සාධාරණත්වය, සාමය, සහජීවනය වැනි වටිනාකම් මත ය. එබැවින් සාමූහික ඉදිරි ගමනක් සඳහා බහුවිධ වාදී නූතන සමාජය තුළ සාමකාමී සහජීවනය අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී ඇත.

පෞද්ගලික ව හෝ සාමූහික ව හුදෙකලා වී ජීවත් වීම යහපත් නොවේ. එක් පුද්ගලයකු තවත් කෙනෙකුගේ දෘෂ්ටිය දැක්ම හෝ මතය ප්‍රතික්ෂේප කිරීම නිතර ම බිඳුණු සබඳතා කෙරේ යොමු කරවයි. මෙසේ අන්‍යයන්ගේ අදහස් බැහැර කිරීම "බහිෂ්කාරවාදය" (exclusivism) යනුවෙන් අපි හඳුන්වමු. එහි දී උත්සාහ ගන්නේ තමන්ගේ අදහස් පමණක් ඉස්මතු කිරීමට ය. යම් පුද්ගලයකු තවත් කෙනකු කෙරේ බලපෑමක් කරමින් ඒ තැනැත්තා ව පාලනය කිරීමට යන විට සබඳතා දෙදරා යයි අපි එය "අඩංගුතාවය" (inclusivism) යනුවෙන් හඳුන්වමු. මේ දෙයාකාරයෙන් ම සිදුවන්නේ පෞද්ගලික ව හා සාමූහික ව සබඳතා බිඳ වැටීම යි.

තම අදහස් අන්‍යයන් හා බෙදා ගැනීමට හැකි වීම මූලික මිනිස් අයිතිවාසිකමකි. එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥාප්තියෙන් ද මෙය අනුමත කොට ඇත. එබැවින් වාචික ව හෝ ජීවිතාදර්ශනයෙන් අන්‍යයන්ට සිය ආගම් ප්‍රකාශ කිරීම වරදක් නොවේ. එහෙත් තම ආගමේ විශේෂත්වයන් උපුටා දැක්වීමෙන් හෝ මුදල් සහ ද්‍රව්‍යමය ආධාර බෙදා දීමෙන් අන්‍යයන් සිය ආගමට හරවා ගැනීමට උත්සාහ කිරීම අනුමත කළ නොහැකි ය.

"අන් කිසිවකු ගැළවීමක් නැත,
මන්ද, අපේ ගැළවීම සලසා දෙන ලද
අන්කිසි නාමයක් මුළු ලොවෙහි ම මිනිසුන්
අතර නැත " ක්‍රියා 4 : 12

තවත් මෙවැනි බයිබල් පාඨ කිහිපයක් ද බහිෂ්කාරවාදය සඳහා ඉදිරිපත් කළ හැකිවුවත් බයිබලය තුළ ම අඩංගුතාවාදය පිළිබිඹු කෙරෙන පාඨ ද වේ.

මානව සබඳතා වර්ධනය කිරීම තුළින් සහජීවනයක් ඇති කිරීම සඳහා බහිෂ්කාරවාදය හා අඩංගුතාවාදය බැහැර කොට බහුවිධවාදය ප්‍රචලිත කළ යුතු ය.

යහපත් සමාජයක් ගොඩනැඟීමට හේතු වන සාධක දක්නට ලැබේ. කෙනෙකුගේ දැක්ම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට පෙර නිවැරදි සබඳතා පවත්වා ගත යුතු ය. යහපත් මානව සබඳතා පවතින විට අන්‍යයන්ට වෛර කිරීමක් සිදු නොවේ. සිදු වන්නේ පිළිගැනීම ගරු කිරීම හා නිවැරදි වීම යි. එවැනි තත්ත්වයක් සැමතැනක ම ඇති විය යුතු ය. එය බහුවිධවාදයයි. ( Pluralism )

නූතන සමාජය බහුවිධවාදය මත රැඳී පවතී. මිනිසුන් වශයෙන් ආහාර, නිවාස, ඇඳුම් පැලඳුම් ආදී විවිධ තලයන්හි බහුවිධවාදය පිළිගැනීමට අපට සිදු වේ. නව අදහස් නව සොයාගැනීම් සහ නව තාක්ෂණය අපි පිළිගනිමු. එහෙත් ආගමික ජීවිතය තුළ බොහෝ දෙනෙකුට බහුවිධවාදය පිළිගැනීම අපහසු වී ඇත.

යහපත් ජීවිතයක් සඳහා ජේසුස් වහන්සේගේ ජීවිතය ආකෘතියක් ( Model ) ලෙසින් සැලකිය හැකිය. ජේසුස් වහන්සේගේ ජීවිතය සියලු යහපතෙහි එකතුවකි. වචනයෙන් ක්‍රියාවෙන් හා ජීවිත රටාවෙන් ජේසුස් වහන්සේ සියල්ලන් සමග දේව රාජ්‍යත්වය බෙදා ගත් සේක. ආචාර ධර්මයන්ට පටහැනි කිසිවක් උන්වහන්සේ නොකළ සේක. උන්වහන්සේගේ ජීවන රටාව ආගමික ජීවිතයට පමණක් අදාළ වුවක් නොවේ. පූර්ණ ජීවිතයක් සඳහා එය මඟ පෙන්වීමක් විය. එබැවින් වර්තමාන සංදර්භය තුළ මාංශවත් වූ ජේසුස් වහන්සේගේ ජීවන රටාව ආකෘතියක් ලෙස අනුගමනය කරමින් මානව සබඳතා වර්ධනය කර ගනිමින් ජීවත් වීම තුළ සාමය සහ සහජීවනය අත්දැකිය හැකි ය.

## සාමය හා සහජීවනය

සාමය හා සහජීවනය අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස පවත්වා ගෙන යාම සඳහා මානුෂිකත්වය වැදගත් වේ. යහපත් මිනිස් වටිනාකම් දේව රාජ්‍යත්වයෙහි වටිනාකම් ලෙස සැලකිය හැකිය.

හෙබ්‍රෙව් භාෂාවෙන් ශාලොම් යනුවෙන් ද ග්‍රීක භාෂාවෙන් අයිරිනේ යන්නෙන් ද ව්‍යවහාරික සාමය යන්නෙන් යහපත් සබැඳියා, එක්සත්කම හා යහපත් ජීවිතය අර්ථවත් වේ. යුක්තිය පදනම් වූ සාමය හා සහජීවනය ඒකාන්තයෙන් ම යහපත් සබඳතා ගොඩ නංවයි. නපුරට මමත්වයට, පීඩාකරනු ලැබීමට හා ප්‍රචණ්ඩත්වයට එහි ඉඩක් නොමැත.

## සියලු දෙනා ම දෙවියන් වහන්සේගේ ජනතාව ය

මිනිසා දේව සමානත්වයෙන් මවා ඇති බැවින් (උත්පත්ති 1 : 26 , 27, 2 : 7 ) සියලු දෙනා ම දෙවිඳුන්ගේ ජනතාව ය. (ක්‍රියා 10 : 11  23 ) එබැවින් උසස් පහත් යනුවෙන් හෝ වෙනත් කිසිඳු ආකාරයක බෙදීමක්  මගින් ගැටළු ප්‍රශ්න ඇති කළ නොහැකි ය. සියලු දෙනා ම අන්‍යයන් පිළිගැනීමෙන් අන්‍යයන්ට ගරු කිරීමෙන් හා සියලු දෙනා සමඟ ම අවබෝධයෙන් ජීවත් විය යුතු ය.

## බහුවිධ සාමජය තුළ සාමය සහ සහජීවනය

- ජේසු මෙහෙවර -

ජේසුස් වහන්සේ එදා සමාජයේ පැවති විවිධ බෙදීම් පිළිගත්තේවත් අනුමත කළේවත් නැත. බෙදීම් ඉක්මවා යන නව අනන්‍යතාවයක් ජේසුස් වහන්සේ අවධාරණය කළ සේක. මෙම අනන්‍යතාවය දළු ලා වැඩෙන්නේ සාමය හා සහජීවනය සමඟ ය. යුදෙව් ජනතාව බෙදීම් තුළ ජීවත්වෙමින් දේව නමස්කාරයේ යෙදුනත් ජේසුස් වහන්සේගේ එම තත්ත්වය වෙනස් කරමින් බෙදීම්වලින් තොර ව සැබෑ ආත්මයෙන් යුතු ව නමස්කාර කිරීමේ අගය පහදමින් සාමය හා සහජීවනය ඇති කළ සේක. දිනපතා ජීවිතයේ දී උන්වහන්සේ යුදෙව් හා සමාරිත යන ද්විත්ව ජන කොටස් සමඟ ම යහපත් සබඳතා පැවැත් වූ සේක.

වෙනස්කම්වලින් යුතු ජනතාව අතර සාමය සහ සහජීවනය වර්ධනය කිරීම සඳහා ජේසුස් වහන්සේ චින්තනය අවබෝධ කර ගත යුතු ය. පාවුල් තුමා ජේසුස් වහන්සේගේ මෙහෙවර පැහැදිලි කළේ සහජීවනයේ මෙහෙවරක් ලෙසිනි. (එපිස 2 : 11  23 ) ජුදෙව් අය හා අන්‍යජාතින් අතර පැවති බෙදීම පිටු දකිමින් ජේසුස් වහන්සේ නව සම්බන්ධතා ඇති කළ සේක. ඒ  තුළින් උන්වහන්සේ ඔවුන්ට නව අනන්‍යතාවයක් ලබා දුන් සේක. ( එපිස 2 : 15  16 පේදුරුතුමා ද මෙම නව අනන්‍යතාව පැහැදිලි කළේ ය. ඒ අනුව කිතුනුවෝ තෝරාගත් වංශයක් ද රාජකීය පූජක පෙළක් ද ශුද්ධ ජාතියක් ද දෙවියන් වහන්සේ සතු සෙනඟක් ද වෙති. මෙම නව අනන්‍යතාවය මනුෂ්‍යත්වයට පමණක් සීමා වුවක් නොවේ. ස්වභාව ධර්මයට ද උරුමවන්නකි. (රෝම 8 : 20 22 ) බෙදීම් ඉක්මවා ඉන් ඔබ්බට ගමන් කරමින් දෙවියන් වහන්සේ ජනතාවට ලබා දෙන පූර්ණ විමුක්තිය යහපත් සබඳතාව මත පදනම් වූ අනන්‍යතාව ලබා දෙයි.

## බහුවිධ සමාජය තුළ සාමය හා සහජීවනය  - පාවුල්ගේ මෙහෙවර -

පාවුල් තුමාගේ චින්තනය අනුව ද සාමය හා සහජීවනය බෙදීම් ඉක්මවා යයි .ඔහු පවසන්නේ ශරීරයේ ඇති එකිනෙකින් වෙනස් අවයව ශරීරය ශක්තිමත් කරන්නාක් මෙන් මනුෂ්‍යයන්ගේ වෙනස්කම්, ප්‍රශ්න ඇති නොකොට මිනිසාට ජීවනය ලබා දෙන බවයි.
( 1 කොරින්ති 12 : 12  31 )

විවිධතා පදනම් කරගත් බෙදීම අභිභවා යමින් සමානාත්මතාවය පදනම් කරගත් සමාජයක සාමයෙන් සහ සහජීවනයෙන් යුතු ව මිනිසා ජීවත්විය යුතු බව ඔහු කොලොස්සිවරුන්ට ලියන ලද හසුන් පතින් පැහැදිලි වේ. ( කොලොස්සි 3 : 11 ) ඒ අනුව සාමකාමී සහජීවනයෙන් යුතු නව ජීවිතය තුළ ග්‍රීක ජුදෙව් හෝ චර්ම ඡේදිත අචර්මඡේදිත හෝ ම්ලේච්ඡ ශිෂ්ට හෝ දාස නිර්දාස යනුවෙන් හෝ භේදයක් නැත. ඊට අමතර ව ස්ත්‍රී පුරුෂ භේදයක් නැත. ( කියවන්න ගලති 3 : 28 )

නව ප්‍රබෝධාත්මක ක්‍රියාවලියක් ලෙසින් වන නව අනන්‍යතාවයෙන් යුතු ජීවිතය පාපය හා ව්‍යවස්ථාව ඉක්මවා යයි. එහි වහල් භාවයට ඉඩක් නැත. ආත්මාර්ථයේ වහලුන් මෙන් නොව ප්‍රේමයේ වහලුන් මෙන් ජීවත් විය යුතු ය. (ගලාති 5 : 13 ) නපුරේ ආධිපත්‍යයෙන් ඉවත් වීම වැදගත් වේ. (රෝම 6 : 2 14 ) සරල ව හා යහපත් සාරධර්ම සහිත ව ජීවත් විය යුතු ය. (රෝම 6 : 1 8 22 ) යහපත හා අයහපත සිදු කිරීම පිළිබඳ අරගලයෙන් ඔබ්බට ගොස් යහපත කිරීම සඳහා දේව කරුණාවෙන් ජීවිත් විය යුතු ය. (රෝම 7 : 14 24 ) ක්‍රිස්තුස් වහන්සේගේ නව ජීවිතයෙන් සැරසීමේ දී බාධකවලට (රෝම 8 : 12 ) හෝ බෙදීම්වලට ඉඩක් නැත. (1 කොරින්ති 1 : 13) එබැවින් සාමය හා සහජීවනය බෙදීම ඉක්මවමින් මිනිසාට නව ජීවිතයක් උදා කරයි.

## නව සබඳතා හා නව ජීවිතය

නව සබඳතා ඇති කිරීම තුළින් නව අනන්‍යතාවය සමඟ සාමයය හා සහජීවනය ඇති කිරීමේ උපකරණය බවට අප පත්විය යුතු ය. ඒ මගින් ජේසුස් වහන්සේගේ මෙහෙවර ද පාවුල් ගේ මෙහෙවර ද මෙන් අපට ශ්‍රී ලංකාව තුළ සහජීවනය සඳහා මෙහෙවරෙහි යෙදිය හැකි වනු ඇත.

වර්තමාන ශ්‍රී ලංකාවේ පැණ නැගෙන ගැටළු අද ඉතා තීරණාත්මක ස්වභාවයක පවතී. ජනවාර්ගික ගැටළුව විවිධ මට්ටම්වල පීඩාවට පත් කිරීම්, කාන්තාවන්ගේ හා දරුවන්ගේ අනාරක්ෂිත ස්වභාවය, දිළින්දන් වඩාත් දිළිඳු භාවයට පත්වීම, ප්‍රචණ්ඩත්වයේ සංස්කෘතිය ගෝලීයකරණයේ ගැටළු යන මේවා මිනිස් ජීවිතය ප්‍රශ්නාවලියක් බවට පත් කරයි. මෙම ගැටළුවල ප්‍රතිඵලයක් වශයෙන් මිනිසා අසහනයට පත් ව ඇත. එසේ ම විවධ මට්ටම් තුළ භේද ඉස්මතු වෙමින් පවතී. මෙම සංදර්භය තුළ යුක්තිය හා සාධාරණත්වය ද මානව සම්පත් බෙදා ගැනීම ද පෙරදැරි කරගත් තත්ත්වයක් තුළින් සහජීවනය වර්ධනය කර ගත යුතු ව ඇත.

මමත්වය මධ්‍යගත නොවූ සබඳතා සැම කෙනෙකු විසින් ම ගොඩනඟා ගනු ලැබිය යුතු ය. අපි මෙය " නව සහජීවනය " ලෙස හඳුන්වමු. මෙම තතත්වය සමාජයට ද ඇතුළත් විය යුතු අතර එය හඳුන්වන්නේ සමාජයේ ඇතුළාන්ත සහජීවනය ලෙස ය.

පෞද්ගලික ව ද සමාජයක් වශයෙන් ද අපට දෙවිඳුන් සමඟ නව සබඳතා ගොඩනඟා ගැනීමට සිදු වේ. දේව රාජ්‍යත්වයේ වටිනාකම් පදනම් වන්නේ දෙවිඳුන් හා සමඟ පවතින සබඳතාවය මත ය. දෙවිඳුන් අදහන අයට මානව වටිනාකම් පදනම්කර ගත් යහපත් ජීවිත ගත කළ හැකි ය.

ස්වාභාව ධර්මය සමඟ ද පෞද්ගලික ව හා සමාජයක් වශයෙන් ගැඹුරු සම්බන්ධතාවක් පවත්වා ගත යුතු ය. පරිසරය කෙටි කාලීන ව විනාශ නොකිරීම තුළින් පාරිසරික සමතුලිතතාව රැක ගැනීම මඟින් නාය යාම්, වියළි බව හා ජල ගැලීම් වළක්වා දිගු කාලීන ව පාරිසරික බලපෑමෙන් මිදිය හැකි ය.

පුද්ගලාන්තර සබඳතා වර්ධනය කිරීමෙන් ද අන්තර් සමාජයීය සම්බන්ධතා ගොඩනඟා ගැනීමෙන් ද ප්‍රේමය රජයන සමාජයක් ඇති කළ හැකි ය.

ආයුධ රජ කිරීම තුළින් නපුර ජය ගැනීම සිදු වේ.

"මා ප්‍රචණ්ඩත්වයට විරුද්ධ වන්නේ ඒ මඟින් යහපත සිදු කරනු පෙනෙන විට එය තාවකාලික යහපතක් වන අතර ඒ මගින් සිදුවන නපුර කල්පවතින බැවිනි."

අවි ආයුධ ඉවත දැමූ ජේසුස් වහන්සේ වර්තමාන සංදර්භයට අදාළ කර ගත යුතු ව ඇත.



ආයුධ සංස්කෘතිය බිඳ දැමූ ජේසුස් වහන්සේ (යෙසායා දිවැසිවරයාගේ චින්තනය ඉදිරියට ගෙන ගිය සේක.)

සියලු මට්ටම්වල සාමය පදනම් වූ සහජීවනයක් ඇති කළ යුතුය. නැවත නැවත අළුත් විය යුතු ය. බහුවිධ සමාජයක සතුටින් යුතු ව ජීවත් විය හැක්කේ එවිට ය.

## සම්බන්ධතා ජාලය

### හුදෙකලා වීම


- පුද්ගලයෙක්
- අනෙක් පුද්ගලයා
- දෙවියන් වහන්සේ
- ස්වාභාව ධර්මය

### අසම්පූර්ණ සබඳතා

- පුද්ගලයෙක්
- පුද්ගලයෙක් — අනෙක් පුද්ගලයා
- පුද්ගලයෙක් — දෙවියන් වහන්සේ
- පුද්ගලයෙක් — ස්වාභාව ධර්මය

### සහජීවනය

- පුද්ගලයෙක් — දෙවියන් වහන්සේ
- පුද්ගලයෙක් — අනෙක් පුද්ගලයා
- පුද්ගලයෙක් — ස්වාභාව ධර්මය
- පුද්ගලයෙක් තමන්



❖ **ඇගැයීම :-**

පහත දැක්වෙන යථාර්ථවාදී සංදර්භයක් තුළ සහජීවන මෙහෙවර තුළින් බලාරොත්තු විය හැකි යහපත් ප්‍රතිඵල පැහැදිලි කරන්න.

1.පිරිමියාට වඩා කාන්තාව පහත් තත්ත්වයක සිටින බවට වන ආකල්පය.

2. ධනවතා හා දිළිඳුන් අතර පවතින බෙදීම.

3. අධ්‍යාපනය ලැබුවන් හා නොලැබුවන් අතර පවතින තත්ත්වය.

4. දිස්ත්‍රික්ක අතර බෙදීම.